## පළාත් මට්ටමින් සිදු කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි 8.4.1 (ආ) පරිදි රේඛීය අමාත්‍යාංශය වශයෙන් අප අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන හා පළාත් සභා වලට ඔවුන්ගේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූල වන පරිදි නාගරික අපද්‍රව්‍ය කළමනාකරණයට පහසුකම් සැලසීම හා මාර්ගෝපදේශන සිදු කළ යුතුවේ. තවද එම ජාතික ප්‍රතිපත්තියට අනුව නාගරික ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීමද මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති වගකීමකි. එබැවින්, මෙම සියලු අවශ්‍යතා ඉටු කර ගැනීමේ අරමුණෙන් යුතුව ජාතික ඝන අපද්‍රව්‍ය කළමණාකරන සහයක මධ්‍යස්ථානය විසින් අරමුණු පහක් මුල්කරගනිමින් මෙය ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

1. එක් එක් පළාතේ පළාත් පාලන ආයතනවල කසළ කළමණාකරන කටයුතුවල සාර්ථකත්වය පිළිබඳ සොයා බැලීම.
2. පළාත තුළ කසළ කළමණාකරන කටයුතු වලදී උද්ගතව පවතින ගැටලු හඳුනාගැනීම.
3. දැනට අනුමතව පවතින ජාතික හා ජාත්‍යාන්තර ප්‍රතිපත්තීන් සියලු පළාත්වල බලාත්මක කිරීම.
4. හඳුනාගෙන ඇති යහ පරිචයන් පිළිබඳ දැනුම සියලු පළාත් වෙත ලබා දීම.
5. පළාත් පාලන ආයතන වල ඝන අපද්‍රව්‍ය කළමණාකරන කටයුතුවල යෙදෙන නිලධාරීන් සඳහා පුහුණුවීම් ලබා දීම.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ආවරණය වන පරිදි එක් එක් පළාතට එක් දින වැඩමුළුවක් බැගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර දැනට පළාත් දෙකක මෙම වැඩමුළුව පැවැත්වන ලදී. එහි තොරතුරු පහත පරිදි වේ.

| දිනය | පළාත | වැඩමුළුවට සහභාගී වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|
| 2024.06.26 | නැගෙනහිර පළාත | 90 | කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකය, ත්‍රිකුණාමලය |
| 2024.07.26 | දකුණු පළාත | 174 | ලබුදූව, දක්ෂිණපාය, ගාල්ල |

### නැගෙනහිර පළාත












**දකුණු පළාත**














